표준안

# විදේශ ශ්‍රමිකයින් සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මත පවත්වනු ලබන විභාගය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම්දීම

**2025 අගෝස්තු**

Ministry of Employment and Labor

HRDK Human Resources Development Service of Korea

# කොරියානු භාෂා පරීක්ෂණය නිවේදනය කිරීම-2025

දකුණු කොරියාවේ රැකී රක්ෂා සහ කම්කරු අමාත්‍යාංශයත් (MOEL) ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයත් අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ඇගයුම් මත ලකුණු ලබාදීම මගින් ශ්‍රමිකයින් බඳවා ගැනීම සඳහා වන ක්‍රමවේදය මෙම වසරේදීත් ක්‍රියාත්මක කිරිමට තීරණය කර ඇත.

මෙම ඇගයුම් මත ලකුණු ලබාදීමේ ක්‍රමය මගින් අපේක්ෂකයින් සතු කොරියානු භාෂා හැකියාව පමණක් නොව කුසලතාවය,කායික තත්ත්වය සහ වැඩ පළපුරුද්ද පිළිබඳ ගැඹුරින් සොයා බලනු ලැබේ.

අපේක්ෂකයින්ගේ කායික තත්ත්වයන් පරික්ෂා කිරීමේදී වර්ණ අන්ධතාවය සහ වර්ණ දුර්වලතා සහිත අයට මේ සඳහා ඉදිරිපත් වීමට අවසර නොලැබේ.වර්ණ අන්ධ හෝ වර්ණ දුර්වලතා ඇති අය මේ සඳහා සුදුසුකම් නොලබන අතර, කොඳුඇට පෙළ ආබාධ,කපා ඉවත් කරන ලද ඇඟිලි ආදිය ඇති අය රැකියා ධාරිතාවයේ තක්සේරුවේ ප්‍රතිඵල මත පදනම්ව අවසාන සලකා බැලීමෙන් බැහැර කළ හැකිය.

අදාළ කර්මාන්ත සඳහා රැකියාඅපේක්ෂිතයින් තෝරාගනු ලබන්නේ ඔවුන් ලබාගන්නා ඉහළ ලකුණු මට්ටම අනුව වේ.පළමු වටය සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් අවම ලකුණු මට්ටමට වඩා ඉහළින් සිටිය යුතුයි.

පළමු වටයේ සමත් වන්නන් හට කුසලතා පරීක්ෂණයක් හා නිපුණතා පරීක්ෂණයකින් සමන්විත දෙවන වටය සඳහා අවස්ථාව ලැබේ.කුසලතා පරීක්ෂණයේදී අවම වශයෙන් නියමිත ලකුණු ප්‍රමාණය ලබාගත යුතු අතර දෙවන වටයේදී පරීක්ෂණ දෙකෙහිම ලකුණු එකතු කරනු ලැබේ.

ඒ අනුව, සියලුම පරීක්ෂණ වලට ලැබෙන ලකුණු එකතු කර ඉහලම ලකුණු ගන්නා අය ඇගයුම් ක්‍රමවේදය මගින් සමත් කරනු ලැබේ .

මෙම පරීක්ෂණ ක්‍රියාවලියේ, දෙවන වටය තුළදී අපේක්ෂකයින් තමා තෝරාගත් කර්මාන්තයට අදාළවසේවා පළපුරුද්ද, ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් සහ ක්ෂේත්‍රයට අදාළව පුහුණු පාඨමාලා සම්පූර්ණ කර තිබේ නම්, නිපුණතා පරීක්ෂණය සඳහා එම ලේඛණ ඉදිරිපත් කළ හැකිය. පළමු අදියරට අදාළ පරීක්ෂණය සමත් වූවන්ට පමණක් කුසලතා පරීක්ෂණයට ඉදිරිපත් විය හැකිය.කුසලතා පරීක්ෂණයට සහභාගී නොවන අයදුම්කරුවන් විභාගය සමත් වීමට සුදුසුකම් නොලබයි.

අපේක්ෂකයින් විසින්  EPSපරීක්ෂණයේ විභාගඅයදුම්පත් ඉල්ලුම් කිරීමට පෙර තමාගේ වර්ණ අන්ධභාවය සහ වර්ණ  දුර්වලතා පිළිබඳ තත්ත්වයන් පරික්ෂා කරගත යුතුය.

තවද, වර්ණ අන්ධභාවය සහ වර්ණ දුර්වලකම් ඇති අය කුසලතා පරීක්ෂණයේදී හඳුනාගනු ලැබුවහොත් විභාගය සමත් කරනු නොලැබේ.එසේම යම් අපේක්ෂකයෙකුගේ කායික තත්ත්වය ඉල්ලුම් කරන ලද ක්ෂේත්‍රය සඳහා  සුදුසු නොවන බව තීන්දු වුවහොත්එම පිරිසද මෙම තෝරාගැනීම් වලින් ඉවත් කරනු ලැබේ.

2025 අගෝස්තු

විභාගය පැවැත්වීම : රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යංශය -දකුණුකොරියාව

ක්‍රියාත්මක කිරීම : කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය

සහයෝගීතාවය : විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## ඇගයීම් හා ලකුණු ලබාදීමේ ක්‍රමය

### ✓ අරමුණ

TOPIK -EPS ○ ක්‍රමවේදය තුළ තිබෙන රැකියා අපේක්ෂිත ලැයිස්තුව මගින් කොරියානු සේවා යෝජකයින්ට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් වන කාර්ය පැවරුම් සම්පූර්ණ කිරීමේ කාර්යක්ෂමතාවය, පුද්ගල කායික සුදුසුකම් සහ කර්මාන්තයට අදාල අත්දැකීම් නිරීක්ෂණය කිරිමට හැකියාවක් ඇත.

කොරියානු භාෂාව කථාකිරීම අඩු මට්ටමක පවතින,නමුත් කාර්ය සාධනයේදි නිපුණතා මට්ටම පලපුරුද්ද ඉහල අයට ද මේ සඳහා අවස්ථාව ඇත.

### ✓ ක්‍රියා පටිපාටි

1වන වටය

+ TOPIK-EPS

වර්ණ පෙනීමේ ඌනතාවය තක්සේරු කිරීම

බඳවා ගැනීමේ කෝටාව මෙන් ගුණයක් 1.1 දක්වා පිරික්සීම

2වන වටය

කුසලතා පරීක්ෂණය + )අනිවාර්යය(

රැකියා පළපුරුද්ද (විකල්ප)

1 වන සහ 2 වන වටයේ ලකුණු එකතුව මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් අපේක්ෂකයින් තෝරා ගැනීම

අවසාන සාර්ථක අපේක්ෂකයින්

### ✓ සංයුතිය සහ ලකුණු වෙන් කිරීම

**සංයුතිය සහ ලකුණු වෙන් කිරීම**

1වන වටය**(TOPIK – EPS)**

- පරික්ෂණකාලපරිච්ඡේදය (ප්‍රශ්න) : මිනිත්තු 50 [කියවීම (ප්‍රශ්න 20), මිනිත්තු 25 , සවන්දීම (ප්‍රශ්න 20 ) මිනිත්තු 25],
- EPS –TOPIK පිළිබඳව ප්‍රශ්න අලුතින් හදුන්වා දුන් සම්මත පෙලපොත මත පදනම් වනු ඇත.

2) -වන වටය(කුසලතා පරීක්ෂණය + ශාරීරික යෝග්‍යතාවය(අත් ශක්තිය සහ පිටුපස ශක්තිය) සම්මුඛ පරීක්ෂණ සහ මූලික කුසලතා පරීක්ෂණ වලින් සමන්විත වේ.

ලබාදන ලේඛනවල අදාල ක්ෂේත්‍රයේ රැකියා පළපුරුද්ද, සහතික හා පුහුණුවකනිෂ්ඨ විද්‍යාල ඩිප්ලෝමාවකට සමාන හෝ ඊට වැඩි (නැව් තැනීම සහ නිෂ්පාදන, සඳහා පමණක්) සහ ජාතික මට්ටමේ සුදුසුකම් ඇතුලත් විය යුතුය.

○ ලකුණු වෙන් කිරීම සහ සමත් අසාර්ථක නිර්ණායක

1 වන වටය අඩුම ලකුණු සීමාව ඉක්මවා යන අය අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ගැනීම

එක් එක් කර්මාන්තය සඳහා අවම ලකුණු සීමාව බඳවාගැනීමේ කෝටාවේ සංඛයාවෙන් 1:1 ගුණයකින් ඉක්මවා යන අයුරින් ඉහලම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් තෝරා ගැනීම

2) -වන වටය (කුසලතා පරීක්ෂණයේ පරිපූර්ණ ලකුණු වලින් 60% වඩා අඩු ලකුණු ලබාගන්නා අය පරීක්ෂා කිරීම

| කර්මාන්ත | ලකුණු | 1වන වටය | 2වන වටය | රැකියා ධාරිතා තක්සේරුව (අමතර ලකුණු) | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුළු ලකුණු | වැඩ අත්දැකීම් | පුහුණුව | ක්ෂේත්‍ර පළපුරුද්ද | සුදුසුකම් |
| නිෂ්පාදන හා ධීවර _ | **200** | 100 | 100 | **5** | 2<br>1* | 1 | 1 | 1 |

- සෘතුමය රැකියා කාණ්ඩය යටතේ මීට පෙර කොරියාවේ මාස 05කට වඩා සේවය කර ඇති විදේශීය සේවකයන්ට (E-8 ) අමතර ලකණු ලබාදෙනු ලැබේ

**✓ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා දඬුවම්**

○ ඉදිරිපත් කරන ලද කිසියම් ලේඛනයක් අසත්‍ය බව ඔප්පු වුවහොත් ප්‍රතිපල අවලංගු කරන අතර එම අයදුම්කරුව වසර හතරක් සඳහා රැකිය බලපත්‍ර ක්‍රමය (EPS) ඉල්ලුම් කිරීම තහනම් කෙරන අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ සාකච්ඡා කර ගත යුතු නීතිමය ක්‍රියාමාර්ගවලට යටත් වනු ඇත.

**1වන අදියර**

ලේඛන සමාලෝචනය
( සත්‍යාපනය )
රැකියා නිපුණතාවය
ලියාපදිංචි කිරීම

→

**2වන අදියර**

කුසලතා පරීක්ෂණ සම්මුඛ
පරීක්ෂණ අතරතුර
තොරතුරු සත්‍යතාව
තහවුරු කිරීම සඳහා ප්‍රශ්න
**HRDK]සහ සම්මුඛ පරීක්ෂක[**

→

**3වන අදියර**

තොරතුරු සත්‍යතාව නැවත
තහවුරු කිරීම
**HRDK]සහ යැවීමේ**
**නියෝජිතායතනය[ ශ්‍රී ලංකා**
**විදේශ සේවා නියුක්ති**
**කාර්යාංශය**

# I පරීක්ෂණ සඳහා මාර්ගෝපදේශ

## ලකුණු පාදක කරගත් ක්‍රමයේ කාල සටහන

| දැනුම්දීම | TOPIK (1-EPSවන වටය( | | | | නිපුණතා පරීක්ෂණය 2)වන වටය( | | | විභාගය සමත් අය නිවේදනය කිරීම |
|---|---|---|---|---|---|---|---|---|
| | අයදුම්පත් ඉදිරිපත් කිරීම | දිනය සහ ස්ථානය නිවේදනය කිරීම | ක්‍රියාත්මක කිරීම | සාර්ථක අපේක්ෂකයින් ප්‍රකාශයට පත් කිරීම සහ 2වන වටය සඳහා කාල නියමය | ලේඛන ඉදිරිපත් කිරීම | දිනය සහ ස්ථානය නිවේදනය කිරීම | ක්‍රියාත්මක කිරීම (රැකියා ධාරිතා තක්සේරුව සමග ඒකාබද්ධව) | |
| 2025 අගෝස්තු 18 | 2025 සැප්තැම්බර් 15 - 2025 සැප්තැම්බර් 17 | 2025 ඔක්තෝබර් 03 | 2025 ඔක්තෝබර් 15 - 2026 මාර්තු 18 | 2026 මාර්තු 30 | 2026 මාර්තු 30 – 2026 අප්‍රේල් 02 | 2026 අප්‍රේල් 08 | 2026 අප්‍රේල් 20 – 2026 අප්‍රේල් 24 | 2026 මැයි 04 |

*අයදුම්කරුවන් සංඛ්‍යාව හා ස්ථානීය තත්ත්වය මත ඉහත සඳහන් වේලාවන් /කාලරාමුව වෙනස් විය හැකිය

## .2බඳවා ගැනීමේ කෝටාව (සැලසුම් කරන ලද)

| කර්මාන්ත | බඳවා ගැනීමේ කෝටාව (කාලසටහන) | අවසාන තේරීම සඳහා නිර්ණායක |
|---|---|---|
| **නිෂ්පාදනය** | **පුද්ගලයන් 2000** | එක් එක් කර්මාන්තය සඳහා වර්තමාන බඳවා ගැනීමේ කෝටාව වෙත ළඟා වීම සඳහා පළමු හා දෙවන වටයන්හි ඒකාබද්ධ පරීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් තෝරා ගැනීමට<br>※වර්ණ අන්ධතාවය සහ ගැටළු ඇති අය හැර |
| **ධීවර කර්මාන්තය** | **පුද්ගලයන් 500** | |

*අවසානයේ දී සමත් අපේක්ෂකයින් ප්‍රමාණය ලබා දී ඇති බඳවාගැනීම් කෝටාවට වඩා අඩු නම් තෝරා ගැනීම් ක්‍රියාවලිය නැවත සිදුකළ යුතුය.

## අයදුම් කිරීම සඳහා විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍ර

A. ලකුණු පාදක කරගත් තෝරා ගැනීමේ ක්‍රමවේදයේදී අයදුම්කරු නිෂ්පාදන හෝ ධීවර කේෂ්ත්‍ර වලින් එක් ක්ෂේත්‍රයක් පමණක් **තෝරාගත යුතුය.**

| කර්මාන්ත | විශේෂිත ප්‍රදේශ |
|---|---|
| නිෂ්පාදනය | *ආහාර නිෂ්පාදන ක්ෂේත්‍ර<br>*ලෝහ නොවන අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රිකරණය කිරීම<br>*දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන<br>*රෙදිපිලි ආශ්‍රිත නිෂ්පාදන,ඇගළුම් හැර<br>*ඇඳුම් පැලඳුම්.ඇඳුම් උපාංග හා ලොම් භාණ්ඩ නිෂ්පාදනය<br>*ලෙදර් ආශ්‍රිත කර්මාන්ත, ගමන් මළු සහ පාවහන්<br>*ලී නිෂ්පාදනය සහ ගෘහ භාණ්ඩ හැර ලී සහ කිරළ නිෂ්පාදන<br>*පාප්ප ආශ්‍රිත නිෂ්පාදන, කඩදාසි සහ කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන<br>*පටිගත කරන ලද මාධ්‍ය මුද්‍රණය කිරීම සහ ප්‍රතිනිෂ්පාදනය කිරීම<br>*කිරල, ගල් අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන<br>*රසායන ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, වෛද්‍ය සහ ඖෂධ රසායන ආශ්‍රිත නිෂ්පාදන<br>*ඖෂධ , ඖෂධීය රසායන හා උද්භිත විද්‍යාත්මක නිෂ්පාදන<br>*රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන<br>*වෙනත් ලෝහ නොවන ඛණිජ ආශ්‍රිත නිෂ්පාදන<br>*ලෝහ ආශ්‍රිත මූලික නිෂ්පාදන<br>*යන්ත්‍රෝපකරන හා ගෘහ භාණ්ඩ හැර පිරිසැකසුම් කරන ලද ලෝහමය නිෂ්පාදන<br>*ඉලෙක්ට්‍රොනික් නිෂ්පාදන, පරිගණක,ශබ්ද හා චලන, සන්නිවේදන උපකරණ ආශ්‍රිත නිෂ්පාදන<br>*වෛද්‍ය, නිරවද්‍ය සහ දෘශ්‍ය උපකරණ, ඔරලෝසු සහ ඔරලෝසු ආශ්‍රිත නිෂ්පාදන<br>*විද්‍යුත් උපකරණ ආශ්‍රිත නිෂ්පාදන<br>*මෝටර් වාහන ආශ්‍රිත නිෂ්පාදන, ට්‍රේලර් සහ අර්ධ ට්‍රේලර් නිෂ්පාදන<br>*මෝටර් වාහන ආශ්‍රිත අමතර කොටස් හා කොටස් නිෂ්පාදනය<br>*අනෙකුත් ප්‍රවාහන උපකරණ ආශ්‍රිත නිෂ්පාදන<br>*නැව් සහ බෝට්ටු නිෂ්පාදනය<br>*ලී බඩු නිෂ්පාදනය<br>*අනෙකුත් නිෂ්පාදන<br>*කර්මාන්ත, යන්ත්‍ර හා උපකරණ ආශ්‍රිත නඩත්තු සේවා කළමනාකරණය<br>*ප්‍රතිසාධනය කළ හැකි ද්‍රව්‍ය විසුරුවා හැරීමහා වර්ගකිරීම, ද්‍රව්‍ය ප්‍රතිසාධනය<br>*අපතේ යන ලෝහ විසුරුවා හැරීම,වර්ග කිරීම හා නැවත ප්‍රතිස්තාපනය<br>*අපතේ යන ලෝහ වර්ග කිරීම හා විසුරුවා හැරීම<br>*ලෝහ අපද්‍රව්‍ය නැවත ලබාගැනීම<br>*ලෝහ නොවන අපද්‍රව්‍ය විසුරුවා හැරීම, වර්ග කිරීම හා නැවත ලබාගැනීම<br>*ලෝහ නොවන අපද්‍රව්‍ය විසුරුවා හැරීම හා වර්ග කිරීම<br>*පාන වර්ග නිෂ්පාදනය |
| ධීවර කර්මාන්තය | *ජලජීවී වගාව<br>*මසුන් ඇල්ලීම<br>*ලුණු නිස්සාරණය |

Bපළමු වටය සමත්වීමෙන් පසු තෝරාගත් කර්මාන්තය වෙනස් කළ නොහැක .

**Cඑක්අපේක්ෂකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පත්‍රයක් පමණි**

## .4 අයදුම්කරුගේ සුදුසුකම්

A වයස අවුරුදු 18-39 (1985 සැප්තැම්බර් 15 සිට 2007 සැප්තැම්බර් 14 දක්වා උපන්)

B සිරගත කිරීම් හෝ දැඩි නීතිමය දඬුවම් පිළිබඳ අපරාධ වාර්තාවක් නොමැති අය

C කොරියාවෙන් බලහත්කාරයෙන් පිටුවහල් කිරීම හෝ පිටවීම පිළිබඳ ඉතිහාසයක් නොමැති අය විය යුතුය

D සංචාරක තහනමක් නොතිබිය යුතුය.

E වර්ණ අන්ධභාවය හෝ වර්ණ දුර්වලතා නොමැති අය (,කොඳුඇට පෙළ ආබාධ,ඇඟිලි අඩු හෝ ඉවත් කර ඇති පුද්ගලයින් විභාගය ඉල්ලුම් කලද දෙවන වටයේදී එය දැඩි පරීක්ෂාවට ලක් කරනු ලැබේ.)

කොරියාව තුල E- 9 වීසා කාණ්ඩය හෝ E-10 වීසා කාණ්ඩය යටතේ වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති අයයි.

* අයදුම්පත්‍රය තුල කොරියාවේ රැදී සිටි කාලසීමාව ලකුණු කළ යුතුය.

*ඉහත සඳහන් කරන ලද වීසා කාණ්ඩ යටතේ වසර 05කට වඩා කොරියාවේ රැදී සිට අත්දැකීම් සහිත පිරිස් සඳහා EPS-TOPIK වෙත අයදුම්කළ නොහැකිය.

*<u>විදේශ ශ්‍රමිකයන් සේවයේ යෙදවීම පිළිබඳ පනතේ 18-2 (2 ) වගන්තියට අනුව රැකියා කටයුතු සඳහා අවසර ලබාදී ඇති අය සඳහා වසර හයක සේවා කාලයක් සහ සේවා කාලය දීර්ඝ කිරීම</u>.

## .5ලකුණු පාදක ක්‍රමය යටතේ අයදුම්පත් ඉදිරිපත් කිරීම

**සටහන -**අයදුම්පත්‍ර සම්පුර්ණ කිරීමට අදාල උපදෙස් සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙබ් අඩවිය වන www.slbfe.lk වෙත 2025.09.04 දින පිවිසෙන්න.

.Aඉදිරිපත් කිරීමේ කාලය:(2025.09.15 -2025.09.17 දක්වා )

.Bඉදිරිපත් කළ යුතු ස්ථානය :ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

.Cඉදිරිපත් කල යුතු ක්‍රමවේදය :ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය

හරහා

.Dඅවශ්‍ය ලියකියවිලි

## 1. **අයදුම් පත්‍රය** -ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය

◦**සෑම අයදුම් පත්‍රයකම පරීක්ෂණ අයදුම්පත් අංකය මුද්‍රණය කර ඇති අතර සෑම අයදුම්කරුවෙකුටම එක් අයදුම්පත්‍රයක් පමණක් ගැනීමට අවසර ඇත.**

**නිවැරදි කිරීම් සිදුකල යුතු නම්, අදාල ස්ථානයේ එය පැහැදිලිව නිවැරදි කරන්න.**

## 2.වලංගු **විදේශ ගමන් බලපත්‍රයේ පිටපත ඉදිරිපත් කළ යුතුය.**

◦අයදුම්පත් ලබාගන්නා දින සිට ඉදිරියට මාස 03ක් වලංගු වූ ගමන් බලපත්‍රයක් තිබිය යුතුය.

*අයදුම්පත්‍රයේ ඇතුලත් කර ඇති කිසියම් පුද්ගලික තොරතුරු විදේශ ගමන් බලපත්‍රයේ ඇති දත්ත වලට වඩා වෙනස් වන්නේ නම්, ඇතුළු වීමට අවසර නොලැබේ.

*අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර සියළුම තොරතුරු අනුකූල වීම සහතික කිරීම සඳහා අයදුම්කරුවන් සම්පූර්ණයෙන්ම වගකිව යුතුවේ.

◦ඔබ විභාග පරීකෂණ වලින් සමත්ව කොරියාවේ රැකියාවක් ලැබීමට සුදුසුකම් ලැබුව හොත් එම රැකියා අයදුම්පත්‍රයේ අතුලත් කරනු ලබන ඉංග්‍රීසි නම, උපන් දිනය,ස්ත්‍රී පුරුෂ බව ඡායාරූපය කොරියාවේ රැකියා අයදුම්පතට ඇතුලත් කරන අතර,පසුව ඒවා වෙනස්කල නොහැක

◦උඩුගත කරනු ලබන ලිපිලේඛණ වල ධාරිතාව 600 Pixels 100KBහෝ ඊට වඩා අඩු විය යුතුය.

## 3.පසුගිය මාස හය තුළ සුදු පසුබිමකින් ලබාගත් **ස්කෑන් කරන ලද විදේශ ගමන් බලපත්‍ර ඡායාරූපයක ( 4.5CM x3.5CM )**ගොනුව

◦ **ඔබ විසින් උඩුගත කරන ලද ඡායා රූපය ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සුදුසු විය යුතුය.**
KB 15 ප්‍රමාණයට නොඅඩු, Pixel ප්‍රමාණය 100-300 වන JPG ආකෘතියේ ඡායාරූපයක් විය යුතුය.

## 4. **අයදුම්පත් ගාස්තු ගෙවීම**

.E අයදුම්පත් ගාස්තුව 28 USD සමාන මුදලක් වන ශ්‍රී ලංකා රුපියල් 8428.48 විය යුතුය.

◦ ඉදිරිපත් කරන කාල සීමාව තුළ නොවැළැක්විය හැකි හේතුන් මත අයදුම්කරුවන් අයදුම්පත ඉල්ලා අස්කර ගන්නේ නම් අයදුම්කරුවන් සඳහා අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. (අයදුම්පත ඉල්ලා අස්කර ගත් පසු නැවත ඉල්ලුම් කල නොහැක )

**.6 පරීක්ෂණ ස්ථානය සහ පරීක්ෂණ දින නිවේදනය කිරීම**

.A ස්ථානය -ශ්‍රී ලංකාවේ UBT ( විභාග මධ්‍යස්ථානයේ ලිපිනය ඉදිරියේදි දැනුම් දෙනු ලැබේ)

.B පරීක්ෂණ අවශ්‍යතා පිළිබඳ නිවේදනය :2025.10.03 සිකුරාදා

.C අයදුම්කරුවන් සඳහා පරීක්ෂණ දින ප්‍රකාශයට පත් කිරීම

1.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය

2.EPS TOPIK වෙබ් අඩිවිය (epstopik.hrdkorea.or.kr)

## Ⅱ EPS-TOPIK ( පළමු වටය)

### 1. කාලසීමාව ( TBD) 2025.10.15 (සඳුදා) -2026.03.18 ( බදාදා )

**ඉහත දක්වා ඇති විභාග දිනයන් ස්ථානීය තත්ත්වය මත වෙනස් විය හැකිය.එක් එක් අයදුම්කරුවන්ට නියමිත විභාග දින හා වේලාවන් ඉහත විස්තර කර ඇති පරිදි දැනුම් දෙනු ලැබේ.**

**2.ක්‍රමවේදය ( UBT )**

**2025.09.04 දිනින් www.slbfe.lk හි UBT උපදෙස් අඩංගු අත්පොත පලකරනු ලැබේ.**

### .3පරීක්ෂණ කාලසටහන

| පරීක්ෂණ සැසිය | පරීක්ෂණ දුව්‍ය භාරදීම සහ පරීක්ෂක රැස්වීම | අයදුම්කරුවන් දැනුවත් කිරීම | කාල සීමාව | |
|---|---|---|---|---|
| | | | කියවීම (මිනිත්තු 25) | සවන්දීම ( මිනිත්තු 25 ) |
| 1වන සැසිය | 08.50-09.00 | 09.00-09.30 | 09.30- 09.55 | 09.55-10.20 |
| 2වන සැසිය | 10.20 -10.30 | 10.30 -11.00 | 11:00- 11.25 | 11.25-11.50 |
| 3වන සැසිය | 12.50 -13.00 | 13.00-13.30 | 13.30 -13.55 | 13.55-14.20 |
| 4වන සැසිය | 14:20-14.30 | 14.30-15.00 | 15.00-15.25 | 15.25-15.50 |

*සියළුම අයදුමකරුවන් නියමිත වේලාවට විභාග මධ්‍යස්ථානය වෙත පැමිණිය යුතුය ( සෑම සැසියක් වෙනුවෙන්ම 09.00,10.30,13.00 හෝ 14.30)

*විභාග කාලසීමාව හා දිනකට නියමිත සැසි ප්‍රමාණයන් වෙනස් විය හැක

### .4 දළ විශ්ලේෂණය

| වර්ගය | ප්‍රශ්ණ ගණන | මුළු කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| කියවීම | 20 | විනාඩි 50 | පරිපූර්ණ ලකුණු 100 |
| සවන් දීම | 20 | | |
| මුළු | **40** | | |

*ප්‍රශ්ණ ප්‍රමාණයන් හා කාලසීමාවන් වෙනස් විය හැකිය.

Aසමත් අසාර්ථක නිර්ණායක

(1 **( සංයුතිය)** -බහුවරණ ප්‍රශ්න විසඳීම

(2) කියවීම /සවන් දීම

3)වර්ණ ඌනතාවය තක්සේරු කිරීම.

සමත් /හෝ අසමත් නිර්නායක -විවිධ කර්මාන්ත වල අවම ලකුණු සීමාවන් ඉක්මවා යන අය අතරින් බඳවාගැනීමේ කෝටාව බඳවා ගැනීමේ කෝටාව මෙන් 1.1 ගුණයකින් තෝරාගත් ඉහලම ලකුණු ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව.

.B පරීක්ෂණ දිනයේදී පරීක්ෂණ අයදුම් පත්‍රය,ගමන් බලපත්‍රය හා නිපුණතාවයට අදාල ලේඛණයන්හි පිටපත් රැගෙන ඒමට වගබලා ගත යුතුය.

| |
|---|
| ◦ අයදුම්පත්‍රය සමඟ යොමුකරන ලද ගමන් බලපත්‍ර පිටපත රැගෙන එන්න |
| ◦ නියමිත ගමන් බලපත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අය පරීක්ෂණ ස්ථානයට ඇතුළත් නොකෙරේ. |

**.1රැකියා ධාරිතාව තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි**

.A ඉලක්ක :නියමිත EPS –TOPIK පරීක්ෂණ දිනයේදි එක් එක් කර්මාන්තය සඳහා අවම සමත් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ට රැකියා පලපුරුද්ද, පුහුණුව, අධ්‍යයන පසුබිම සහ කර්මාන්තයට අදාල සුදුසුකම් පිලිබඳ ලේඛණය ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබයි.

පළමු වටයේ තෝරාගත් අපේක්ෂකයින් අතර, රැකියා ධාරිතා තක්සේරුව මගින් අදාල ක්ෂේත්‍ර වල සේවා පලපුරුද්ද ඇති සහ පුහුණු අත්දැකීම් ඇති අය කණිෂ්ඨ විද්‍යාල ඩිප්ලෝමාවකට සමාන හෝ ඊට වැඩි අය ජාතික සුදුසුකම් සඳහා ඉදිරිපත් කරන ලද ලේඛණ හරහා පරීක්ෂා කරනු ලැබේ.

B.යොමු කළ යුතු EPS-TOPIK පරීක්ෂණ කාමරය.

C.ඉදිරිපත් කළ යුතු ලිපිලේඛණ

1.ගමන් බලපත්‍රය හා EPS-TOPIK අයදුම්පත

2.රැකියා ධාරිතාව තක්සේරු කිරිමේ අයඳුම්පත

3.රැකියා ධාරිතා තක්සේරුවට අදාල අභ්‍යන්තර ලේඛණ යොමු කිරීම ( පරීක්ෂණ දිනයේදි මුල් පිටපත් රැගෙන විත් ඡායා පිටපත් ලබාදිය යුතුය )

| වර්ගය | ලේඛන | විස්තර | සටහන |
|---|---|---|---|
| මූලික ( අවශ්‍යතා) | අයදුම්පත( ඇමුණුම 3-1) | මූලික තොරතුරු ( අයදුම්පත් අංකය,කර්මාන්තය, රැකියා ධාරිතාවය,පෞද්ගලික තොරතුරු | අදාල ස්ථානයේ හෝ වෙනත් ස්ථානයක සිට සම්පූර්ණ කල යුතුය |
| වැඩ පලපුරුද්ද | වැඩ පලපුරුද්දට අදාල සහතික | මූලික තොරතුරු(පෞද්ගලික තොරතුරු) වගකීම,රැකියා කාලසීමාව,සේවා ස්ථානය,ආයතනික මුද්‍රාව ( අත්සන සමග) | සේවා ස්ථානයෙන් නිකුත් කිරීම අවශ්‍ය නම්,කරුණාකර (3-2)පෝරමය භාවිතා කරන්න |
| වෘත්තිය පුහුණු පළපුරුද්ද | වෘතතිය පුහුණු මධ්‍යස්ථානයක් තුල සම්පූර්ණ කරන ලද සහතික පත්‍ර පාඨමාලා | මූලික තොරතුරු ( පෞද්ගලික තොරතුරු) පුහුණු ස්ථානය, පුහුණු කාලසීමාව, පුහුණු පාඨමාලා නම, ආයතනික මුද්‍රාව ( අත්සන සමග ) | සම්පූර්ණ කිරිමේ සහතිකය ආදේශකයක් ලෙස භාවිතා කළ හැක. පුහුණු පාඨමාලා නම ඉවත් කළ හැකිය. |
| ශාස්ත්‍රිය පසුබිම | උපාධි (හදාරමින් සිටින) සහතිකය හා ශාස්ත්‍රිය උපාධි සහතිකය | මූලික තොරතුරු ( පෞද්ගලික තොරතුරු) දෙපාර්තමේන්තුව හා අදාල අංශය උපාධිය ලැබූ දිනය, උපාධිය,නිල මුද්‍රාව ( අත්සන) | උපාධි සහතිකය ඉදිරිපත් කළ හැකිය. උපාධි ක්ෂේත්‍රය වෙනස් විය හැක. |
| ජාතික සුදුසුකම් | ජාතික සුදුසුකම් සහිත සහතික | මූලික තොරතුරු ( පෞද්ගලික තොරතුරු) සුදුසුකම් සහිත නාමාවලිය, ලබාගත් දිනය,සුදුසුකම් තත්ත්වය,නිල මුද්‍රාව ( අත්සන ) | සුදුසුකම් සහිත සහතික ලබාගැනීම ආදේශ කල හැක. සුදුසුකම් මට්ටම නොසලකා හැරිය හැකිය. |

*ඉදිරිපත් කරන ලද ලේඛණ ව්‍යාජ හෝ අසත්‍ය බව ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු වන අතර, ඉදිරි වසර 04 සඳහා EPS TOPIK වෙත මුහුණ දීම තහනම් වේ. එසේම ඒ පිළිබඳව නිතිමය කටයුතු සිදුකරනු ඇත.

**හඳුනා නොගත් සේවා පළපුරුද්ද, සුදුසුකම් සහ පුහුණුව හා අධ්‍යයන පසුබිම**

1(වැඩ පලපුරුද්ද) අයදුම්කරුවන්ගේ සේවා පලපුරුද්දට අදාල ක්ෂේත්‍ර වල (නිෂ්පාදන,ධීවර,ඉදිකිරීම්,කෘෂිකර්ම /පශු සම්පත් කටයුතු )ක්‍රියාකාරකම් ඇතුලත් වුවද, ඒවා සරල විකුණුම්, ව්‍යාපාර පරිපාලනය ( ගිණුම්කරණය ,පිරිස් කළමනාකරණය ආදිය ) අධ්‍යාපනය,රාජ්‍ය නිළධාරියෙකු හෝ රාජ්‍ය ආයතන කාර්යය මණ්ඩල සාමාජිකයෙකු ලෙස සම්බන්ධ වීම( තාක්ෂණික හෝ කුසලතා ආශ්‍රිත රැකියා මාලාවක් හැර) සේවා කර්මාන්තයේ නියැලීම ( ඉවුම්-පිවුම්, ගෑස් පිරවුම්හල්,අවන්හල්,කොණ්ඩා මොස්තර ආදිය) නම් ඒවා රැකියා ධාරිතාවය ලෙස පිලිගනු නොලැබේ කෙසේ වෙතත්,අදාල අයදුම්කරු කර්මාන්තයට විශේෂිත වූ ශිල්පීය ක්‍රම/කුසලතාවයට අදාල අධයාපනයේ නියැලී සිටී නම්, අධ්‍යාපනයේ සේවා පළපුරුද්ද පිලිගනු ලැබේ

උදාහරණය -වෘත්තිය පුහුණු ආයතනයක ප්‍රායෝගික යන්ත්‍රෝපකරණ සඳහා මහාචාර්යය වරයෙකු ( ගුරුවරයෙකු )ලෙස පලපුරුද්ද

2.( පුහුණුව, අධ්‍යයන ) කර්මාන්තයක විශේෂිත රැකියා කාර්යයන්ට අදාල නොවන අරමුණු සහිත පුහුණු මාඨමාලා හෝ අධ්‍යයන පසුබිම පිලිගනු නොලැබේ.

උදාහරණය I :-රැකවරණ සේවකයින්,ගිණුම්කරණ කාර්යය මණ්ඩලය, කළමනාකරණ විධායකයින් සඳහා වන පාඨමාලා.

උදාහරණය II:- වෛද්‍ය විද්‍යාව, ශාරිරික අධ්‍යයන, හෙද සේවය,ගිණුම්කරණය වැනි නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ නොවන ප්‍රධාන විෂයයන්

3.( සුදුසුකම් ) -කර්මාන්තයක විශේෂිත රැකියා කාර්යයන්ට අදාල නොවන සුදුසුකම් (බලපත්‍ර ) පිලිගනු නොලැබේ.

උදාහරණය:- රියදුරු බලපත්‍ර, භාෂා සහතික, වෘත්තිය බලපත්‍ර ( වෛද්‍ය ,ඖෂධවේදි, නීතිඥ )

මීට අමතරව සේවා සපයන්නන්ගේ බලපත්‍ර (ඉවුම් පිහුම්, කොණ්ඩා මෝස්තර ආදිය ) අධ්‍යයන උපාධි ආදිය

**6 පළමු වටයෙන් සමත් දෙවන වටයට අයදුම්කරුවන් පිලිබද නිවේදනය කිරිම.**

A. දිනය 2026.03.30 ( සඳුදා)

B. 1.(ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ( www.slbfe.lk )

2.රැකියා බලපත්‍ර ක්‍රමයට අදාල වෙබ් අඩවිය (eps.go.kr )

3.රැකියා බලපත්‍ර ක්‍රමයට අදාල EPS-TOPIK වෙබ් අඩවිය ( epstopik.hrdkorea.or.kr)

4.විභාග ප්‍රථිඵල රැකියා බලපත්‍ර ක්‍රමයට අදාල ඉංග්‍රිසි වෙබ් අඩවිය ( eps.go.kr )

## III.කුසලතා පරික්ෂණය ( දෙවන වටය )විභාග දිනයන් හා විස්තර නිවේදනය කිරීම.

.A දිනය 2026.04.08 ( බදාදා )

B (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ( www.slbfe.lk )

## 2.කුසලතා පරීක්ෂණය සහ රැකියා ධාරිතාව තක්සේරු කිරීම

## A.විභාග කාලසීමාව -2025.04.20 ( සඳුදා)-2026.04.24 ( සිකුරාදා )

| වාරය | පූර්ව රැස්වීම සහ සූදානම | අයදුම්කරු දිශානතිය (මිනිත්තු 30) | පරීක්ෂණ කාලය ( පැය 3 ) | ලකුණු ලබා ගැනීම |
|---|---|---|---|---|
| 1වන සැසිය | 08.00-08.30 | 08.30 -09.00 | 09:00 -12.00 | 12.00-12.30 |
| 2වන සැසිය | - | 12.30- 13.00 | 13:00 -16.00 | 16:00-17.00 |

*නම් කරන ලද පරීක්ෂණ දිනය හා ස්ථානය වෙනස් කල නොහැකිය.නියමිත වේලාවට පසුව පැමිණෙන අයදුම්කරුවන් විභාග ස්ථානය වෙත යොමු නොකෙරේ.

*රැකියා ධාරිතාවයන්ට අදාල සහතිකපත් පරීක්ෂා කිරීම කුසලතා පරීක්ෂණයේදී සිදුකරනු ලබයි.

## B.සංයුතිය හා ලකුණු ලබාදීම

(සංයුතිය ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය (අත් ශක්තිය හා පිටුපස ශක්තිය),සම්මුඛ පරීක්ෂණය සහ මූලික කුසලතාවය ( පොදු හා විශේෂිත)

| කර්මාන්ත | මුළු | කුසලතා පරීක්ෂණය | | | ධාරිතා තක්සේරුව J ob | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | සම්මුඛ පරීක්ෂණය | මූලික කුසලතා | වැඩ පළපුරුද්ද | පුහුණු | ශාස්ත්‍රීය පසුබිම | සුදුසුකම් |
| නිෂ්පාදන හා ධීවර | **105** | 30 | 30 | 40 | 2(1) | 1 | 1 | 1 |

## Ⅲ අවසාන සාර්ථක අපේක්ෂකයින් නිවේදනය කිරීම

### 1දිනය-2026.05.04 (සඳුදා)

### .2 නාලිකා

1.යොමුකරන ආයතනයේ වෙබ් ලිපිනය( www.slbfe.lk )

2.රැකියා බලපත්‍ර ක්‍රමයට අදාල වෙබ් ලිපිනය ( eps.go.kr )

3.රැකියා බලපත්‍ර ක්‍රමයට අදාල EPS TOPIK වෙබ් ලිපිනය ( epstopik.hrdkorea.or.kr )

### .3පරීක්ෂණ ප්‍රතිඵල පරීක්ෂා කරන්නේ කෙසේද:රැකියා බලපත්‍ර ක්‍රමයට අදාල වෙබ් අඩවිය (eps.go.kr)

**4.නිවේදනය කල දින සිට විභාගය සමත් අපේක්ෂකයාගේ වලංගු කාලය වසර 02කි.**

| IV | සටහන්<br><br>1.වර්ණ අන්ධතාවය සහ වර්ණ දුර්වලතා ඇති අය කොදුඇට පෙළ දුර්වලතා ඇති අය, කපා ඉවත් කල ඇඟිලි ආදිය ඇති අය රැකියා ධාරිතාවය සඳහා සුදුසුකම් නොලබයි.දෙවන වටයේ පරීක්ෂාවේදී තක්සේරු කරනු ලබන අතර, රැකියා කාර්යයන් ඉටුකිරීමට අපොහොසත් බව සලකනු ලැබුව හොත්,අවසාන සලකා බැලීමෙන් බැහැර කරනු ලැබේ.<br><br>2.වංචා කිරීමට සහය විය හැකි ස්මාට් දුරකථන,ස්මාට් ඔරලෝසු,බ්ලු-ටූත් හෙඩ්ෆෝන්,විදුලි සංදේශ උපකරණ සන්තකයේ තබාගැනීමට හෝ භාවිතා කිරීමට නොහැක.එසේ තබාගැනීම වංචනික ක්‍රියාවක් ලෙස සැලකේ.<br><br>3.රැකියා ධාරිතාවය සඳහා ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කරමින් වංචාවකට සම්බන්ධ වී ඇති බව අනාවරණය වුවහොත්, අයදුම්කරුගේ පරීක්ෂණ ප්‍රතිඵල අවලංගු කරන අතර,රැකියා බලපත්‍ර ක්‍රමයට පෙනී සිටීම වසර 04කට තහනම් කරනු ලැබේ.<br><br>4. EPS –TOPIK අයදුම්පත්‍රයේ ඇතුලත් කර ඇති තොරතුරු ( විශේෂයෙන්ම ඉංග්‍රීසි නම සහ උපන් දිනය ) විදේශ ගමන් බලපත්‍රයේ ඇති තොරතුරු සමග නොගැලපේ නම්,අයදුම්කරු පරීක්ෂණය සමත් වුවද අදාල අයදුම්කරුට රැකියා සොයන්නන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරිමට හෝ කොරියාවට ඇතුළු වීමට ඉඩක් නොලැබේ.<br><br>5.නිකුත් කරන්නාගේ /ඇපකරුගේ නම, සම්බන්ධතා තොරතුරු, අත්සන සහ අනෙකුත් වැදගත් පුද්ගලික තෙරතුරු මග හැරුණ හොත් ( අවලංගු කිරීමට ) සේවා පලපුරුද්ද පිලිබඳ සහතිකය හෝ සේවා පලපුරුද්ද පිලිබඳ සත්‍ය හේතු තහවුරු කිරීම සාක්ෂියක් ලෙස පිලිගනු නොලැබේ. |
|---|---|

.

**රැකියා සොයන්නන්ගේ ලැයිස්තුව**

සියලු පරීක්ෂණ වලින් සමත් වන අපේක්ෂකයින් රැකියා අපේක්ෂකයින්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබා ඇතමුත් මෙය කොරියාවේ රැකියාවන් ලබාදීමට වන සහතිකයක් නොවේ

**වෛද්‍ය පරීක්ෂණ**

මීට පෙර කොරියාවේ නීති විරෝධි ලෙස සිටි අය සහ වෛද්‍ය පරීක්ෂණ වලින් අසමත් වීම වැනි කරුණු මත සිටින අය විභාගය සමත් වුවත්, රැකියා ලැයිස්තුවට ඇතුලත් නොකරනු ඇත.

**මත්ද්‍රව්‍ය පරීක්ෂාව**

කොරියාවට පැමිණි පසු රැකියාලාභින් මත්ද්‍රව්‍ය භාවිතා කල බවට තහවුරුවුවහොත්,නැවත තම රටට පිටත් කර හරිනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ සුදුසුකම්**

**9E** හෝ E-10 වීසා මත වසර 5ක් හෝ ඊටවැඩි කාලයක් කොරියාවේ රැදි සිටි අය මේ සඳහා අයදුම්කිරීමට සුදුසුකම් නොලබයි

**වංචනික ක්‍රියා**

වංචනික ලෙස කොරියවට රැකියාවක් සඳහා පැමිණ ඇති බව තහවුරුවුවහොත්, කොරියාවේ වංචා වැළැක්වීමේ පනත යටතේ දඬුවම් කරනු ලැබේ.

# කර්මාන්තය සඳහා ප්‍රායෝගික කුසලතා පරීක්ෂණ

| කර්මාන්ත | වර්ගය | විෂයට අදාල නම | විස්තර |
|---|---|---|---|
| සියළු | - | කටු ගැසීම | පොදු අරමුණු |
| නිෂ්පාදන සේවා | 1 | ඒකාබද්ධ සම්බන්ධතාවය | |
| | 2 | මැනීම හා කැපීම | |
| | 3 | පයිප්ප වෝල්ටින් | |
| | 4 | ඇඹරුම් යන්ත්‍ර භාවිතය | |
| | 5 | නිෂ්පාදන ඇසුරුම් | |
| | 6 | පැලට් පැටවීම | |
| කෘෂිකර්මය හා පසු සම්පත් | 1 | තණකොල ඉවත් කරන්නෙකු යොදවා ගැනීම | |
| | 2 | බෝග වැපිරීම | |
| | 3 | වැට සවිකිරීම | |
| | 4 | නිෂ්පාදන ඇසුරුම් | |
| | 5 | මැනීම හා මිශ්‍ර කිරීම | |
| | 6 | විල්බැරෝවක් භාවිතා කිරීම | |
| ඉදිකිරීම් | 1 | **Rebar** එකලස් කිරීම | |
| | 2 | පයිප්ප ස්කැෆෝල්ඩ් ස්ථාපනය /විසුරුවා හැරීම | |
| | 3 | ඇඹරුම් යන්ත්‍ර භාවිතා කිරීම | |
| | 4 | පයිප්ප වෝල්ටින් | |
| | 5 | වයර් සම්බන්ධතාවය | |
| ධීවර | 1 | ලණු සැකසීම හා ගැට | |
| | 2 | අල්ලා ගැනීම හා  වර්ගීකරණය, වැපිරීම | |
| | 3 | විල් බැරෝවක් භාවිතා කිරීම | |
| නැව් ආශ්‍රිත නර්මාන්ත | 1 | ඇඹරුම් යන්ත්‍රය භාවිතා කිරීම | |
| | 2 | පයිප්ප වෝල්ටින් | |
| | 3 | කේබල් බැදීම | |
| පතල් කැනීම | 1 | **Reber** එකලස් කිරීම | |
| | 2 | පයිප්ප වෝල්ටින් | |
| | 3 | වයර් සම්බන්ධතාවය | |
| වන විද්‍යාව | 1 | තණකොළ ඉවත් කරන්නෙකු යොදා ගැනීම | |
| | 2 | මැනීම හා කැපීම | |
| | 3 | ලණු සැකසීම හා ගැට | |
| | 4 | පයිප්ප වෝල්ටින් | |

【 ඇමුණුම3- 1】

රැකියා නිපුණතා තක්සේරු කිරීමේ අයදුම්පත්‍රය

මා විසින් රැකියා නිපුණතාවයට අදාලව ඉදිරිපත් කරන ලද ලියකියවිලි ව්‍යාජ ඒවා නම්, ඒ සඳහා මා වගකිව යුතු බව මා පිලිගනිමි.

***ඔබ ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කල හොත් මෙම පරික්ෂණය ඇතුළුවවසර සහතරක් සදහා විභාගය වෙනුවෙන් පෙනී සිටීමට නුසුදුස්සෙක් වේ.**

| | | | | |
|---|---|---|---|---|
| **අයදුම්කරු විසින් සම්පූර්ණ කල යුතුවේ** | | | | |
| **EPS-TOPIK විභාග අංකය** | | | | |
| **කේෂ්ත්‍රය (අයදුමකිරිමට සුදුසු කේෂ්ත්‍රය බලන්න )** | ☐ නිෂ්පාදන<br>☐ ධීවර<br>☐ නැව් තැනීම් | ☐ කෘෂිකර්ම හා පසු සම්පත්<br>☐ සේවා I<br>☐ වන වගාව | ☐ ඉදිකිරීම්<br>☐ සේවා II<br>☐ පතල් කැණීම | |
| **දුරකථන අංකය** | | දිනය | | |
| **නම** | | | ( අත්සන ) | |

*ඔබ ඉහත තෝරා ගන්නා ලද කේෂ්ත්‍රයන් යටතේ සේවය සේවය කර ඇත්නම් අයඳුම් කළ හැකිය.

| අයදුම්කරු විසින් සම්පූර්ණ කල යුතුය |
|---|
| ☐ පලපුරුද්ද (වසරක් හෝ ඊට වැඩි ) |
| ☐ පුහුණුව (පැය 12 හෝ ඊට වැඩි ) |
| ☐ ශාස්ත්‍රීය ( උපාධිය ලබා හෝ උපාධි අපේක්ෂිත |
| ☐ සුදුසුකම් ( 1 හෝ ඊට වැඩි ) |

| යැවීමේ නියෝජිතායතනය මගින් සම්පූර්ණ කල යුතුය | |
|---|---|
| ☐ නිවැරදි | ☐ වැරදි |
| ☐ නිවාරදි | ☐ වැරදි |
| ☐ නිවැරදි | ☐ වැරදි |
| ☐ නිවැරදි | ☐ වැරදි |

*රැකියාවේ අදාලත්වය සහ ඉදිරිපත් කර ඇති ලියකියවිලි අනුවඅදාල කොටු සලකුණු කරන්න.

යැවීමේ නියෝජිත නම අත්සන

පරික්ෂක නම අත්සන

[ ඇමුණුම 3-2 ]

**සේවා පළපුරුද්ද පිලිබඳව සහතිකය**

| හඳුනාගැනීමේ තොරතුරු | | | |
|---|---|---|---|
| EPS-TOPIK අයදුම්පත් අංකය | | | |
| ජාතිය | ගමන් බලපත්‍ර අංකය | | |
| නම | | | |
| දුරකථන අංකය | විද්‍යුත් ලිපිනය | | |
| සහතික කිරීම | සේවා කාලය (වසර.මාසය.දිනය-වසර.මාසය.දිනය ) | තනතුර | රැකියාවේ වගකීම් (කරුණාකර වශයෙන් සඳහන් කරන්න ) |
| | | | |
| | | | |
| | සම්පූර්ණ සේවා කාලය | වසර ---මාසයන් | |

ශ්‍රී ලංකාව හා කොරියාව අතර ඇතිකරගෙන තිබෙන අවබෝධතා ගිවිසුමට අනුව අයදුම්කරුගේ සේවා පලපුරුද්ද සනාථ කර ගැනීම සඳහා මෙම සේවා සහතිකය නිකුත් කිරීම අනිවාර්යය වේ. එම හේතුව අනුව මෙම ලිපිගොනුව වෙනුවෙන් ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි වේ.
වැරදි තොරතුරු ඉදිරිපත් කර ඇත්නම් එය නිති විරෝධි ක්‍රියාවක් බවද දනිමු.

දිනය : වසර. මාසය. දිනය

නිකුත් කරන්නාගේ නම ( අත්සන )

ඉහත සඳහන් කරන ලද තොරතුරු නිවැරදි හා සත්‍ය වේ.

නිකුත් කළ දිනය වසර . මාසය . දිනය

ආයතනයේ නම

නියෝජිත ( ආයතනික මුද්‍රාව හෝ අත්සන )

| ලබන්නා | |
|---|---|
| දෙපාර්තමේන්තුව | |
| තනතුර | |
| දුරකථන අංකය | |
| නම | (අත්සන ) |

**කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ ( HRD ) සභාපතිතුමනි**

*රැකියාවක් පවත්වාගෙන යනු ලබන සමාගමක් ( ආයතනයක් ) මගින් නිකුත් කර ඇත්නම් පමණක් භාවිතා කළ හැකිය.
*සමාගම් (ආයතන )කීපයක සේවය කර ඇත්නම් එක් සේවායෝජකයෙකු සඳහා එක් සහතිකයක් බැගින් ඉදිරිපත් කළ යුතුය.
*EPS පද්ධතිය වෙත ඔබගේ තොරතුරු මේ වන විටත් ඇතුලත් කර ඇත්නම්,අදාල කොරියානු සේවා සහතිකය ඉදිරිපත් කළ හැකිය.